# සාමාන්‍ය සමයේ දසසතරවන සතිය
# අඟහරුවාදා

## පළමුවන කියැවීම

උත්පත්ති පොතෙන් ගත් පාඨයෙකි.

උත්පත්ති 32 : 22–32

"ඔබ දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමඟ පොරබදා ජය ගත් හෙයින් ඔබේ නම ඉශ්‍රායෙල් වන්නේය."

ඒ රාත්‍රියේ ජාකොබ් නැඟිට තමාගේ භාර්යාවන් දෙදෙන ද සේවිකාවන් දෙදෙන ද පුතුන් එකොළොස් දෙන ද රැගෙන ජබ්බොක් නම් තොටුපළෙන් එගොඩ විය. ඔහු ඔවුන් රැගෙන ගඟින් එගොඩ කළ පසු, තමා සතු දේ ද එතෙරට යැවීය. එහෙත් ජාකොබ් තනිව සිටියේය.

එවිට එක්තරා මිනිසෙක් පහන් වනතුරු ඔහු සමඟ පොර බැඳීය. ඒ තැනැත්තා ද ජාකොබ්ගෙන් තමාට ජය නොලැබෙන බව දුටු විට, ඔහුගේ කලවා සන්ධියට පහරක් ගැසීය. එවිට ඔහුගේ කලවා සන්ධිය විසන්ධි විය. ඒ තැනැත්තා ද "පහන් වෙගෙන එන බැවින් මට යන්න හරින්නැ"යි කී විට ජාකොබ් "ඔබ මට ආශිර්වාද කළොත් මිස මම ඔබට යන්න නොහරින්නෙමි"යි උත්තර දුනි. එවිට ඒ තැනැත්තා 'ඔබේ නම කුමක්දැ'යි ඇසූ විට ඔහු ද 'ජාකොබ්' යයි කීයෙන් "මින් මතු ඔබ ජාකොබ් නොවනු ඇත. ඔබ දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමඟ පොරබදා ජයගත් බැවින් ඔබේ නම ඉශ්‍රායෙල් වන්නේ ය"යි කීය.

ජාකොබ් කතා කොට "කරුණාකර ඔබේ නම ද මට කියන්නැ"යි ඉල්ලීය. එවිට ඔහු "ඔබ, මගේ නම අසන්නේ මන්දැ"යි කියා ජාකොබ්ට එහිදී ආශිර්වාද කළේය.

“මා දෙවියන් වහන්සේ මූණට මූණලා දුටු පසුත් මාගේ ජීවිතය තවමත් ආරක්ෂා වී ඇත.” කියා ජාකොබ් එම ස්ථානයට ‘පෙනුයෙල්’ යයි නම් තැබීය. ඔහු ද පෙනුයෙල් පසුකර යද්දී ඉර උදා විය. තමාගේ කලවයේ වේදනාව නිසා ඔහු කොර ගසමින් ගියේ. මේ සිද්ධිය නිසා ඉශ්රායෙල් ජනතාව කලවා සන්ධිය මත වූ මස් ගොබය අද දක්වා අනුභව නොකරති. ඒ මන්ද, ජාකොබ් පහර ලද්දේ කලවයේ එම සන්ධියට බැවිනි.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 17 : 1–3, 6–8, 15

පිළිතුර: සමිඳුනි, මගේ දැහැමි දිවියෙන් මම ඔබේ වත දකින්නෙමි.

ගීය:

සමිඳුනි, මාගේ මේ සාධාරණ යැදුමට සවන් දුන මැනව. මාගේ හඬ ගැසීමට කන් දුන මැනව. මන්ද, මා එය පුදන්නේ අවංක සිතිනි.

මා ගැන තඩු තීන්දුව ඔබෙන්ම පැමිණේවා! ඔබේ දෙනෙතට යුක්තිය පෙනේවා! ඔබ මසිත උරගා බැලූ සේක. රාත්‍රියේ මා පරීක්ෂා කළ සේක. ඔබ මා විමසා බැලූ සේක. එහෙත් කිසි නපුරක් නැති බව දුටු සේක.

දෙවිඳුනි, ඔබට මට පිළිතුරු දෙන නිසා මම ඔබට හඬ ගසමි. මා අයදුමට කන් යොමු කළ මැනව. මාගේ බස් ඇසුව මැනව. මිදුම්කරුවනි, ඔබේ දකුණු අතින් සතුරු බියෙන් අප ගලවනු මැනව. ඔබේ අසිරිමත් පෙම හෙළි කළ මැනව.

ඔබේම දෙනෙත රක්නා සේ මා රැක ගන්න. ඔබ පියාපත් සෙවණෙහි සුරැකිව මා සඟවන්න. මා දමිටු හෙයින් මම ඔබේ මුහුණ දකින්නෙමි. මා අවදි වන කල ඔබේ ස්වරූපය දැක සෑහීමට පත් වන්නෙමි.

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
"මම යහපත් බැටළු එඬේරා වෙමි. මම මාගේ බැටළුවන් හඳුනමි. ඔව්හු ද මා අඳුනති"යි සමිඳාණෝ වදාරණ සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
අපගේ ස්වාමින් ද, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පියාණන් ද වූ තේජසේ පියාණෝ ඔවුන් වහන්සේ අවබෝධ කර ගැනීමේ ප්‍රඥා ආලෝකය ඔබට දානය කර ඔබ කැඳවීමේ බලාපොරොත්තුවෙන් ඔබේ මනස පහදන සේක්වා!
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**මතෙව් 9: 32–38**

"අස්වැන්න බහුල ය. ගොවීහු විරල ය."

ජේසුස් වහන්සේගෙන් සුවය ලැබූ අන්ධයන් පිටත්ව යද්දී යක්ෂාවේශ වූ ගොළුවෙක් උන්වහන්සේ වෙත ගෙනෙන ලද්දේය. යක්ෂයා දුරු කරනු ලැබූ විට ගොළුවා කතා කරන්නට වන. එකල ජනකාය මවිතව, "මෙවැන්නක් ඉශ්රායෙල් රටේ කිසි කලක දක්නට නොලැබිණි"යි කීහ. එහෙත් පරිසිවරු කතා කරමින්, "මොහු යක්ෂයන් දුරු කරන්නේ යක්ෂාධිපතියාගේ අනුහසින් ය"යි කීහ.

ජේසුස් වහන්සේ ඔවුන්ගේ ධර්ම ශාලාවල උගන්වමින් ද රාජ්‍යය පිළිබඳ සුබ අස්න දේශනා කරමින් ද සෑම අන්දමේ ලෙඩ රෝග සුව කරමින් ද සියලු නුවර වල හා ගම්වල සැරිසැරූ සේක.

ජේසුස් වහන්සේ ජනකාය දැක, ඔවුන් එඬේරෙකු නැති බැටළුවන් මෙන් උ ක් ගැහැට විඳිමින් විසිර ගොස් සිටි බැවින් අනුකම්පා කළ සේක. එවිට උන්වහන්සේ සිය ශ්‍රාවකයන්ට කතා කොට, "අස්වැන්න බහුල ය. ගොවීහු විරල ය. එහෙයින් අස්වැන්න කැපීමට ගොවීන් එවන ලෙස අස්වැන්න බාර හිමියාට අයදින්නැ"යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.